# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,151 - 2019 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2019.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 266 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 269 |


*සැ. යු.* -(i) ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 දෙසැම්බර් මස 13 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 නොවැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

---

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

ඇමුණුම 09

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිගේ අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥ පනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2010/10/16 වන දින ප්‍රදානය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/18306 (වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙහිඅත්තකණ්ඩිය, තුවාරගල, අංක 226 ලිපිනයේ පදිංචි ජයසේ ගෙදර ජයසුන්දර මුදියන්සේලාගේ හේමචන්ද්‍ර වෙත ප්‍රදානය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E -88/136 යටතේ 2011/01/24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

එකී උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තුවේ/කෝරලේ කදිරාපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තුවාරගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. අම්. 2262 දරන කට්ටි කැඩීමේ පිඹුරේ රේඛා සටහනේ අංක 115 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් /1.0356 - ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - .

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 84 බිම් කැබැල්ල, |
| නැගෙනහිරට | : | අංක 84 බිම් කැබැල්ල, |
| දකුණට | : | අංක 84, 85, 116, 117 සහ 114 බිම් කැබලි, |
| බස්නාහිරට | : | අංක 114, 84 සහ 116 බිම් කැබලි. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමනාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

2018 ජූලි මස 20 වැනි දින.

11-1241/7

ඇමුණුම 09

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2004.09.10 වන දින ප්‍රදානය කර ඇති අංක පො/සී/මහ/ප්‍ර/10167 (වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙහිඅත්තකණ්ඩිය, මහවනාවෙල, නිකවතලන්ද අංක 250, පදිංචි දොන් සීමන් පටබැඳිගේ කරුණාවතී වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 6/8/3/120 යටතේ 2006.03.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්ථා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

එකී උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩ පත්තුවේ/කෝරලේ සදගලතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නිකවතලන්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 43/20/3 සහ 43/25/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි - විසින් සම්පාධිත අංක මු.පි. අම් 2008 දරන කට්ටි කැඩීමේ පිඹුරේ රේඛා සටහනේ අංක 35 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.084 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම -.

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 31 සහ 34 බිම් කැබලි |
| නැගෙනහිරට | : | අංක 34 සහ 55 බිම් කැබලි |
| දකුණට | : | අංක 55 සහ 36 බිම් කැබලි |
| බස්නාහිරට | : | අංක 36 සහ 31 බිම් කැබලි |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමනාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

2018 ජූනි මස 25 වැනි දින.

11-1241/6

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටත් නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2004.09.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/සී/මහ/ප්‍ර/10166 (ගොඩ) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙහිඅත්තකණ්ඩිය, මහවනාවෙල, නිකවතලන්ද අංක 250, පදිංචි දොන් සීමන් පටබැදිගේ කරුණාවතී වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 6/8/3/119 යටතේ 2006.03.01 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

එකී උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩ පත්තුවේ/කෝරළේ සදගලතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නිකවතලන්ද නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 43/20/3 සහ 43/25/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි - මු. පි. අම්. 1993 දරන කට්ටි කැඩීමේ පිඹුරේ - සම්පාදිත අංක 43/20 සහ 43/25 දරන රේඛා සටහනේ අංක 04 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.200 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම -.

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 03 සහ 05 බිම් කැබලි, |
| නැගෙනහිරට | : | අංක 03 සහ 05 බිම් කැබලි, |
| දකුණට | : | අංක 08, 02 සහ නිකවලන්ද යාය, |
| බස්නාහිරට | : | අංක 08 සහ 05 බිම් කැබලි. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

2018 ජුනි මස 25 වැනි දින.

11-1241/5

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටත් නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2003.09.02 වැනි දින ප්‍රදානය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/5021 (වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන දෙහිඅත්තකණ්ඩිය, බිහිරිසොරොව්ව, අංක 50, පදිංචි වෙහෙරගොඩගේ මැන්ඩිස් වෙත ප්‍රදනය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E - 17/13 යටතේ 2004.06.03 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්ථා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

එකී උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බිම්තැන්න පත්තුවේ/කෝරලේ කදිරාපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බිහිරිසොරොව්ව නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේයර් ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - මු.පි.අම්. 1982 - රේඛා සටහනේ අංක 37 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.037 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - .

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 20 සහ 36 බිම් කැබලි, |
| නැගෙනහිරට | : | අංක 36 සහ 38 බිම් කැබලි, |
| දකුණට | : | අංක 39 සහ 45 බිම් කැබලි, |
| බස්නාහිරට | : | අංක 45 බිම් කැබැල්ල. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

2018 ජුනි මස 25 වැනි දින.

11-1241/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වන උප වගන්තිය යටත් නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2003.09.02 වැනි දින ප්‍රදනය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/5020 (ගොඩ) දරන ප්‍රදන පත්‍රයේ හිමිකරු වන දෙහිඅත්තකණ්ඩිය, බිහිරිසොරොව්ව, අංක 50, පදිංචි වෙහෙරගොඩගේ මැන්ඩිස් වෙත ප්‍රදනය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E - 17/12 යටතේ 2004.06.03 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

එකී උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තුවේ/කෝරලේකදිරාපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බිහිරිසොරොව්ව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - මු.පි.අම්. 1877 අංක 214 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොටඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.212 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - .

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 160 සහ 213 බිම් කැබලි, |
| නැගෙනහිරට | : | අංක 213 සහ 151 බිම් කැබලි, |
| දකුණට | : | අංක 215 සහ 151 බිම් කැබලි, |
| බස්නාහිරට | : | අංක 215 සහ 160 බිම් කැබැල්ල. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

2018 ජුනි මස 25 වැනි දින.

11-1241/3

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටත් නිකුත් කරන ලද ප්‍රදන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කේ. ඒ. සී. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2005.01.20 වැනි දින ප්‍රදනය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/9042 (වාරි) දරන ප්‍රදන පත්‍රයේ හිමිකරුවන දෙහිඅත්තකණ්ඩිය, මහවනාවෙල, අංක 67, පදිංචි හේවාදුනුවිලගේ ධම්මික වෙත ප්‍රදනය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E - 50/02 යටතේ 2006.07.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්ති භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

එකී උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තුවේ/කෝරලේ කදිරාපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහවනාවෙල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - මු.පි.අම්. 2252 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 192 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.050 රූඩ් - විශාලත්වය ඇත්තා වූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - .

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 191 සහ 180 බිම් කැබලි, |
| නැගෙනහිරට | : | අංක 180 සහ 193 බිම් කැබලි, |
| දකුණට | : | අංක 193 සහ 170 බිම් කැබලි, |
| බස්නාහිරට | : | අංක 170 සහ 191 බිම් කැබැල්ල. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

11-1241/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කේ. ඒ. විමල් කුමාර වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිග රු ජනාධිපති විසින් 2005.01.20 වන දින ප්‍රදානය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/9041 (ගොඩ) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙහිඅත්තකණ්ඩිය, මහවනාවෙල, අංක 67, පදිංචි හේවාදුනුවිලගේ ධම්මික වෙත ප්‍රදානය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E-50/01 යටතේ 2006.07.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැතිවීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

එකී උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තුවේ/කෝරලේ කදිරාපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මහවනාවෙල නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 43/25/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු.පි.අම්. 1980 විසින් අංක 43/25 දරන රේඛා සටහනේ අංක 121 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොටඇත්තාවූද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.199 විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - .

| | | |
|---|---|---|
| උතුරට | : | අංක 118 සහ 122 බිම් කැබලි, |
| නැගෙනහිරට | : | අංක 122 සහ 123 බිම් කැබලි, |
| දකුණට | : | අංක 123 සහ 120 බිම් කැබලි, |
| බස්නාහිරට | : | අංක 120 සහ 118 බිම් කැබලි. |

කේ. ඒ. සී. විමල් කුමාර,
නේවාසික ව්‍යාපාර කළමණාකාර,
සී - කලාපය,
දෙහිඅත්තකණ්ඩිය.

11-1241/1

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58645.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/BAT/KPN/47.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 212 ඒ වාකරෙයි උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කනුක්කාමඩු ගමේ FVP 44 හි කැබලි අංක 452 දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.4047 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල ගොඩනැගිල්ල ඉදිකිරීමට වාණිජ කටයුතු සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 451, 210, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 210, 453, |
| *දකුණට* | : | කැබලි අංක 453, |
| *බටහිරට* | : | කැබලි අංක 453, 451. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2019.10.28 වැනි දින සිට 2049.10.27 දක්වා),

*වාර්ෂික බදු මුදල*.- 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු.5,000,000) වඩා වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2019.10.28 වැනි දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 නොවැම්බර් මස 22 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-1491

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.